## ඡන්ද දායකයාගේ වගකීම හා භූමිකාව

ඡන්ද දායකයන්ට තම පළාත් පාලන ආයතනයට තමන් කැමති නියෝජිතයා තෝරා ගැනීම සඳහා ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය ඇත.

යෝග්‍ය අපේක්ෂකයකු තෝරා ගැනීමේ වගකීම ද ඇත. පහතින් දැක්වෙන්නේ යෝග්‍ය අපේක්ෂකයකු තෝරා ගැනීම සඳහා අප යෝජනා කරන මිනුම් දඬු කිහිපයකි.

මැතිවරණ නීති උල්ලංඝණය නොකරන මැතිවරණ ප්‍රචාරක ක්‍රියාවලියේදී හෝ අන් අවස්ථාවලදී හෝ සාමය සුරකින අපේක්ෂකයින් තෝරා ගන්න ප්‍රචණ්ඩ ක්‍රියා, බලහත්කාරකම් හෝ බිය වැද්දීම් තම ඡන්ද ව්‍යාපාරයෙන් සහමුලින් බැහැර කළ අපේක්ෂකයින් තෝරා ගන්න. තමන්ට එරෙහිව ප්‍රචණ්ඩ ක්‍රියාවල නිරත වන අවස්ථාවලදී පවා ප්‍රචණ්ඩ ප්‍රතික්‍රියා නොදක්වන අපේක්ෂකයින් තෝරා ගන්න.

දූෂිත ක්‍රියාවලින් තොර චරිත ලෙස හඳුනාගෙන ඇති අපේක්ෂකයින් තෝරා ගන්න.

පළාත් පාලන ආයතන හා ඒවා සතු බලතල හා සම්පත්වලට ගැළපෙන පැහැදිලි වැඩ සටහන් යෝජනා කරන අපේක්ෂකයින් කෙරෙහි අවධානය යොමු කරන්න.

තමන්ගේ ධනය බලය හෝ බලවතුන් සමග තමන්ට ඇති සබඳතා ප්‍රදර්ශනය කරමින් එබැවින් ඔබගේ ඡන්දය පතන අපේක්ෂකයින් ප්‍රතික්ෂේප කරන්න.

පළාත් පාලන ආයතනවලට අදාළ නොවන යෝජනා හා සටන් පාඨ ඔස්සේ ඔබ නොමග යැවීමට දරනා උත්සාහයන්ට නොරැවටෙන්න.

ආගම, ජාතිය, කුලය, ලිංගිකත්වය ආදී කරුණු පදනම් කරගෙන භේද භින්න කිරීමට යත්න දරන්නන් ප්‍රතික්ෂේප කරන්න.

ඔබගේ ප්‍රධාන වගකීම ඡන්දය පාවිච්චි කිරීමයි. එහිදී ඔබට යෝග්‍ය අපේක්ෂකයකු තෝරා ගැනීමට හෝ නුසුදුස්සන් ප්‍රතික්ෂේප කිරීමට අයිතියක් ඇත.

ධනය බලය එක් රැස් නොකර ගනිමින් ඔබ ප්‍රජාවට වඩාත් හොඳින් සේවය කරන්නට ඉඩ ඇති අපේක්ෂකයා තෝරා ගන්න.

එමෙන්ම මැතිවරණයෙන් පසුව ද වගකීමෙන් යුතු, උනන්දු ඡන්ද දායකයකු ලෙස ඔබගේ පළාත් පාලන ආයතනයේ යහ පාලනය ගැන විමසිලිමත් විය යුතුවේ. විනිවිදභාවයෙන් හා වගකීමෙන් යුතු පාලනයක් පත්වූ සභිකයින්ගෙන් ඉල්ලා සිටීමට ඔබට අයිතියක් ඇත.